# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2020 ඔක්තෝබර් මස 29 වන දින

## II වන කොටස

## අතිරේකය

(2020.11.03 දින නිකුත් කරන ලදී)

ඇප (සංශෝධන)

**1997 අංක 30 දරන ඇප පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් 1997 අංක 30 දරන ඇප පනතේ 6, 12 සහ 18 යන වගන්ති සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තිවල නීතිය බලපෑම වනුයේ එම වගන්තිවල නිශ්චිතව දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් පනවා ඇති දඩ මුදල් වැඩි කිරීම වේ.

එල්.ඩී.—ඕ. 49/2019

**1997 අංක 30 දරන ඇප පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2020 අංක දරන ඇප (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති 1997 අංක 30 දරන ඇප පනතේ වගන්ති, එම වගන්තිවල නිශ්චිතව දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් පනවා ඇති දඩ මුදල් වැඩි කිරීමේ කාර්යය සඳහා එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන වෙනුවට III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති 1997 අංක 30 දරන පනතේ ඇතැම් වගන්ති සංශෝධනය කිරීම.

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

*උපලේඛනය*

(2 වන වගන්තිය)

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *සංශෝධනය කරනු ලබන වගන්ති* | *ඉවත් කිරීම* | *ඇතුළත් කිරීම* |
| 6(2) | රුපියල් දහසකට | රුපියල් පහළොස් දහසකට |
| 12(2) | රුපියල් සියයකට | රුපියල් දස දහසකට |
| 18(5) | රුපියල් එක්දහස් පන්සියයකට | රුපියල් විසි පන්දහසකට |